# කැලණිය විශ්වවිද්‍යාලය-ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

## වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමු වසර පරීක්ෂණය (බාහිර ) - 2008

**BCOM E 1015 – කළමනාකරණ මූලධර්ම**

ප්‍රශ්න සංඛ්‍යාව : හතයි (07) කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

01. i. " වැරදි කළමනාකරණය හේතු කොටගෙන රාජ්‍ය අංශයේ ආයතන අසාර්ථක වී ඇත." ඔබ මෙම ප්‍රකාශය සමග එකඟ වන්නේ ද ? පැහැදිලි කරන්න.

(ලකුණු 12)

ii. ආයතනයකට සිය පරමාර්ථ ලගා කර ගැනීමේදී කළමනාකරුවන්ගේ දායකත්වය වැදගත් වන්නේ කෙසේද ?

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

02. i. කළමනාකරණය පිළිබඳ අධ්‍යයනයේදී, කළමනාකරණයේ ඉතිහාසය අධ්‍යයනය කිරීම වැදගත් වන්නේ ඇයි ? ඔබගේ පිළිතුර උදාහරණ භාවිතයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. නව සම්භාව්‍ය න්‍යාය, සම්භාව්‍ය න්‍යායට සාපේක්ෂව සපුරා වෙනස් න්‍යායක් යැයි ඔබ සිතන්නේද ? හේතු දක්වන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

03. i. " සංවිධානයක අරමුණු සහ උපායමාර්ග අතර කිසිදු වෙනසක් නැත. " මේ පිළිබඳ ඔබගේ අදහස කුමක්ද ? උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ii. සැලසුම්කරණ ක්‍රියාවලියේදී "ශදුඅත" විශ්ලේෂණයේ ඇති වැදගත්කම උදාහරණ සහිතව විස්තර කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

04. i. ආයතනයකට සංවිධාන සටහනක ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ii. බලතල (අධිකාරිය) පැවරීමේ ක්‍රියාදාමය කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 06)

iii. මධ්‍යගතකරණය සහ විමධ්‍යගතකරණය අතර වෙනස දක්වන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

05. i. "සියළුම කළමනාකරුවන් නායකයන් නොවේ " ඔබ මේ කියමනට එකඟ වන්නේද ? ඵලදායි කළමනාකරුවෙකු වීමට අවශ්‍ය සාධක පිළිබඳ අවධානය යොමු කරමින් හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. විවිධ නායකත්ව ශෛලීන් පැහැදිලි කරන්න. කළමනාකාරිත්ව ජාලයට ඔබ එකී ශෛලීන් සම්බන්ධ කරන්නේ කෙසේද ?

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

06. i. තෙල්මා සමාගම තම අයවැය කපා හල අතර එය සේවකයින් අතර චිත්ත ධෛර්ය අඩු වීමකට හේතු විය.

සේවකයින්ගේ අභිප්‍රේරණ මට්ටම ඉහළ දැමීම සඳහා යොදා ගත හැකි මූල්‍ය නොවන ක්‍රම මොනවාද ?

(ලකුණු 08)

ii. හර්ස්බර්ග් ඉදිරිපත් කළ ද්විත්ව සාධක න්‍යාය සහ මැස්ලෝ ඉදිරිපත් කළ අවශ්‍යතා ධූරාවලි න්‍යාය අතර සම්බන්ධය කුමක්ද ?

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

07. i. "ඵලදායි සන්නිවේදනයකින් තොරව කළමනාකරුවන්ට කළමනාකරණය කළ නොහැක." ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද ? හේතු දක්වන්න.

(ලකුණු 08)

ii. සැලසුම් හා පාලනය අතර කිසියම් සම්බන්ධතාවයක් පවති ද ? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 08)

iii. බාහිර විගණනයෙහි කාර්යභාරය පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(මුළු ලකුණු 20)